ශ්‍රීනාත්
මද්දුමගේ



# පොදු ජන සමාජයම ව්‍යවච්ඡේදනය කරන මහා ලේඛකයා

# ඩී බී කුරුප්පු

**මිනිස් අතින් ඉඳී නොවූ මිනිස් වග අතට**
**පිදුණු වන**
**දෙවොලෙහි මුදුනේ '**
**දැල්වෙන මහ මිණි පහනය හිරු.**
**එය නිල්වන් අහස් තලයෙහි සෙවන වුනේ**

තුර ලතා සුසැදි මල් සුවඳ දරන මේ මහා දූපතක් වන් මහාද්වීපයේ පාරම්පරික උරුමක්කාර ඇබෝ ජින්වරු ඉංග්‍රීසි හිරකාරයෝ එන්න ඉස්සෙල්ලා බොහොම සුන්දරව ජීවත් වෙන්න ඇති. ඒ අයට ආවේනික උරුම සංස්කෘතිය බෙදා හදා ගන්න ඇති.... වනය ගෙදරක් කරගත්තු ඒ මිනිස්සු ගුප්ත බවෙන් ආශ්වාදය ලබන්න ඇති. කුරුළු ගීත, විසිතුරු රටා, සුන්දර ශාඛ මණ්ඩලයෙන් පෙරීගෙන එන හිරු රැස්, මලින් ගැවසි තුරුලතා, හිමෙන් වැසුණු කඳු මුදුන්. ඒ සේරම අද අවරට ගිහින්..... එහෙත් එවන් මිනිසුන් පිළිබඳ ලියවුන පුරාණෝක්ති, ජනප්‍රවාද විතරක් ඉතුරු වෙලා තියෙනවා. කාලයත් එක්ක ඒවත් අමතක වෙනවා. ඒක වළක්වන්න බැහැ.

**උපන් බිමේ ඉඳල නොරටක ඇවිත් ඒ සමාජ යාත්‍රාවේ හබල් ගහන කොට අපිට අම්ම දීපු කිරි මතක් වෙනවා. මම එහෙම කිව්වෙ ජීවිතේ අමාරුයි කියන්න නෙමෙයි. ජීවිතේ දුරයි කියන්න. අපිට අපේ රට දුරයි. ඒ දුරු රටෙන් අරන් ආපු තම අතීත සැමරුම් රස සාගරයේ කිමිදෙමින් හැමවිටම**

මේ වෙලාවෙදි කිසියම් වූ හෘදයාංගම මිනිසුන්ට මේ ගැන දැනෙනවා. මේවායේ තියෙන ආත්මීය කතාංග තේරෙනවා. ඔවුන් ඒවාට වටිනාකම් දෙනවා. මම අර කලින් කියාපු කවිය වර්ඩ්වර්ත් කියන ඉංග්‍රීසි කවියා අතින් ලියවුන එකක්... එහි තවත් තැනක ඔහු කියනවා 'දෙවොල් බිමය මිහි තලය හරින තුරු ලතා සුසැදි මල් සුවඳ දරා.....' මං මේ ලියන්නෙ මාතෘකාවෙන් පිට නේද කියලා ඔබට හැඟෙන්න පුළුවන්. ඇත්ත.... මං තාම එන පාර හොයනවා. මට ලියන්න තියෙන්නෙ අපේ ඩී.බී. කුරුප්ප සාහිත්‍යධරයාගේ තවත් නොනවතින ලේඛන චාරිකාවේ ඇබෝර්ජින් (ආදිවාසි) ජනකතා පොත ගැනයි.

කුරුප්පු මහත්තයාගෙ අතින් ලියවුන පොත් බලපු මට මේ පොතේ ලොකු වෙනසක් දැනුන. වෙනද ලියාගෙන ලියාගෙන යනකොට අර පිහිය අතට අරගෙන මල් වැට ආතක් පාතක් නැතිව කපාගෙන කපාගෙන යන කෙනෙක් වගේ හතර අතට වනන ජන්ම ගතිය මේ පොතේ නෑ..... ඒක මට නම් සතුටක්. මේ පොත කියවන කොට පුංචි කතාවක් මතක් වුනා. බොල්ඩ්වින් මහත්තයට මේ ලියවිල්ල ගැන සතුට ප්‍රකාශ කරනවා. මේ අපේ වියපත් තරුණයා මගේ සතුට වැරදියට තේරුම් ගනීද මන්දා. ඒත් තරහ වුනත් කියන්න ආපු එක කියලම දානවා කියලා හිතුවා.

මේ පොත් තියන ජන කතන්දර ගැන එකින් එකට කියන්න ගියොත් ඒක වැඩක් නෑ....

මම ඕස්ට්‍රේලියාවට එන්න තුන් හිතකවත් නොතිබුන පුංචි කාලෙ මුලින්ම ඇබෝජින්වරු ගැන ඇහුවාම මං හිතුවෙ මුං මිනීකන ජාතියක් කියලයි. නමුත් පස්සෙ තමයි දැනගත්තෙ ඇබෝජින්ස්ලව කාල තියෙන්නෙ සුද්දො කියලා....

ඇබෝජින්වරු මේ පොතේ තියෙන ජන කතන්දර එකින් එක මම කියන්න ගියොත් ඒක මහ අපරා දයක් කියලා සැරයක් කිව්වනේ. මේ මම කියන කතාව ඇබෝජින්ලගෙ කොයි පරම්පරාවෙද කියලා නම් මගෙන් අහන්න එපා. මට කියපු එකා ඒක මට කිව්වෙත් නැහැ.

ඔන්න එක දවසක් එපින් පැත්තේ එක වනචාරී

මිනිසුන් ගැන සිංහල අපේ හදවත් කම්පිත කරන්න ඔවුන් ගැන ආයෙත් හිතන්න ලියා තියෙන මේ ජන කතා එකතුවත් අපේ වියපත් තරුණයාගේ අතින් පොත් වගේම රසාලිප්තයි. සකස්කඩ නොකී කට උඹේ කට හුඹස් කට කියනව වගේම මේකත් කියවිය යුතුම අපි නොහිතපු තැන් නොහිතපු දේ කුරුප්පු මහත්තයා හොඳට පලිප්පු දාල බොරදම් කපල අච්චු අකුරු හැටියට පෙන්නල දෙනවා....

කුරුප්පු මහත්තයා මෙදා ගමන තමුන්ගෙ පොතෙන් ජනකතා 45ගැන කතා කරනවා. ඒ හැම කතාවක්ම අපූරුයි. කෙටි නිසා කියවන්න පහසුයි. සමහරවිට අපි නොහිතන දේ ඒවායේ තියෙනවා. විනයක්, නීතියක්, ක්‍රමයක් නැති සමාජ සංවිධාන අබිනක්මන් කරපු මිනිස්සු ගැන සමහර කතාවලින් එතුමා කියනවා. තමුන්ගේ මව්බිමේ වුනත් නොසලකා හරින ලද මිනිසුන් බවට පත්වෙලා නූතන සංස්කෘතිය ඇතුලෙ සරණාගතයො බවට පත්වුන මේ ඇබෝජියන්-

එරෙහිව හඬක් නගන්න ඕනෙ ලේඛකයාම තමයි. ජීවිතේ සැඳෑ සමයේ සිටියත් කුරුප්පු මහත්තයාගෙ පෑන තවමත් ඒ කාර්ය මැනවින් ඉෂ්ට සිද්ධ කරන බව මේ පොතෙන් පැහැදිලියි. සැඳෑ සමයෙ කිව්වට මම ඩී.බී. කුරුප්පු මහත්තයට කියන්නෙ වියපත් තරුණයා කියලා. ඔය ඊයෙ පෙරේදත් ඉසි'පිරිතාලෙ පැත්තෙ පොඩි රවුමක් ගහල ආවා.

හැමදාමත් අනුන් ගැන කතා කලාට තමා ගැන කතා නොකරන මේ බෝල්ඩ්වින් හොරණ තක්ෂිලාවේදී කරුණාසේන ජයලත්ගෙ ලව් එකට බාල්දිය දාපු නිසා ගොලු හදවත නවකතාව බිහිවුනා කියලා තවත් පොතක් ලිව්වනම් හොඳයි කියලයි මට නම් හිතෙන්නෙ. කමක් නෑ. ඊළඟ සැරේ හරි ඒක ලියන්නකො.

ඇත්තටම ඉපැරණි ඔස්ට්‍රේලියානු සංස්කෘතික මිනිසා කැන්සල් වෙලා හුගක් කල්ද නේද



තාත්ත කෙනෙක් එයාගෙ පුතාට මෙහෙම කියනවලු. පුතේ අම්මිට කියපන් ඔය ලොකු බුජමට වතුර පුරවලා ලිපේ තියන්න කියලා. පුතා අහනවා ඇයි තාත්තේ. තාත්ත කියනවා... නෑ බං කාලෙකින් මිනී මස් කෑවෙ නැහැනෙ.. අපි අද රෑට කන්න මිනිහෙක් අල්ලගෙන එමු කියලා..... කොල්ලටත් මාර සැට.... ඔන්න ඉතිං දෙන්න අම්මට පහේ තුනපහ ලෑස්ති කරල බුජම ලිපේ තියන්නත් කියල ගියා බටහිර ඕස්ට්‍රේලියාව පැත්තට මිනිහෙක් අල්ලගෙන එන්න.... දෙන්න රැකල ඉන්නකොට ඔන්න බොලේ ඔරුවක් එනවා වෙරල දිහාට. හොඳට ලංවෙලා බැලුවම ඒකෙ ඉන්නවා ලස්සන ගෑනියෙක්. කොල්ලට දැන් පට්ට සනීපයි. මොකද අද රෑට මිනීමස් ෂුවර්. ඒත් තාත්තා අප්සෙට එකේ. මොකෝ බන් තාත්තෙ. කොල්ල ඇහුවා. නෑ පුතේ මං මේ කල්පනා කලේ මේ ගෑනිව ගෙදර ගෙනියල අද රෑට අම්ම කෑවොත් මොකද කියලා.

ඇත්තටම ඕස්ට්‍රේලියාවෙ ඇබෝජින්වරුන්ට ගිහින් තියෙන කල අපට පේනවා. ඒ අය මේ සංක්‍රමණික ඉංග්‍රීසින්ට කරදරයක් පිළිකුලක්. ඒඅ ය දියා බලන්නෙ කමකට නැති මිනිස්සු දිහා බලන බැල්මෙන්. ඒත් ඒ මිනිස්සුන්ටත් මේ රටේ ආත්මයක් තියෙනවා. ඒ කම්පිත ආත්මයේ රිද්මය කුරුප්පු මහත්තයා ඉතා සංයමයකින් යුතුව මේ ජනකතා පොතට එක්කරලා තියෙනවා. මට මේ පොත කියනකොට මතක් වුනා දොස්තර ස්පිටිල්ව. අපේ රටෙ වැද්දන් ගැන එතුමා ලියාපු ලියවිලි කොයිතරම් අදට ප්‍රායෝගික වෙලා තියෙනවද. කුරුප්පු මහත්තවා සංගම්කාරයාගේ මළගම පොතේ ඉඳලා විටින් විට මේ ආදිවාසීන්ගේ හෘද ස්පන්ධනය අනුදැකල තියෙනවා.

උපන් බිමේ ඉඳල නොරටක ඇවිත් ඒ සමාජ යාත්‍රාවේ හබල් ගහන කොට අපිට අම්ම දීපු කිරි මතක් වෙනවා. මම එහෙම කිව්වෙ ජීවිතේ අමාරුයි කියන්න නෙමෙයි. ජීවිතේ දුරයි කියන්න. අපිට අපේ රට දුරයි. ඒ දුරු රටෙන් අරන් ආපු තම අතීත සැමරුම් රස සාගරයේ කිමිදෙමින් හැමවිටම අපිට කියන මහා සාහිත්‍යධරයෙක් වන ඩී.බී. කුරුප්පු මහත්තයා මේ වතාවෙ ලියන්නෙ අපි ගැන නෙමෙයි. අනුන් ගැන ඇත්තටම මේ කොන් කරනු ලැබූ

වරු ගැන ඕස්ට්‍රේලියානුවන්ට වඩා කැක්කුමක් තමන්ට තියෙන වග කුරුප්පු මහත්තයා මනා ලෙස ඔප්පු කරනවා. ඇත්තටම රතු ඉන්දියානුවන්ට සියැටැල් වගේම ලංකාවේ වැදි ජනතාවට ස්පිටිල් දොස්තර මහත්තයා වගේ ඇබෝජියන්වරු ගැන හිතන කුරුප්පු මහත්තයාගේ උත්සාහය අගය කරන්නම ඕන දෙයක්. මෙරට සංස්කෘතියට හොඳින් අනුගත වෙල තෘප්තියෙන් අතීතය අමතක කරන අපේ බොහෝ මිනිස්සුන්ට ආපිට මනසින් හෝ ඇබෝජියන්වරුන්ගේ ස්වර්ණමය යුගයට ගිහිල්ල හිස් අතින් එන්න නෙමෙයි බොහෝ දේ උකහාගන්න කරන ආරාධනා කුරුප්පු මහත්තයාගෙ මේ පොතේ හොඳින් තැවරිලා තියෙනවා.

කුරුප්පු මහත්තයාගේ ලියවිලි වල මුල ඉඳලම මම අසම්මත ගතියක් දකිනවා. මම හිතනවා ඒ අසම්මතය තමයි අපිව එතුමාගේ ලේඛණ කියවන්න තල්ලු කරන්නෙ කියලා. ඒ වගේම පොදු ජන සමාජයම විච්ඡේදනය කරන ඒ වගේ ලියවිලිවවලට පොදු ජන සමාජයෙන්ම ඉල්ලුමක් හැදිලා තියෙකවා. සමාජය තුල ගො නැගී තිබෙන විසල් විකල්ප චින්තන අවකාශය අවබෝධකරගෙන ලිවීම නිසා එතුමගේ පොත් වෙනස්. එක හුස්මට කියවල ඉවරයක් කරන්නත් පහසුයි.

ඇත්තෙන්ම පවතින විෂම සමාජ ව්‍යාජයන්ට

කියල මෙම පොත කියවන කොට මට නොයෙක් විට හිතුනා. අපිට අහු නොවුන තැන් එතුමාගෙ මේ පොත කියවන කොට මට සැරෙන් සැරේ අහු වුනා. වියපත් තරුණ සමයේ ඉඳගෙන වුනත් මානව සදාචාරාත්මක මෙහෙවරක් කුරුප්පු මහත්තයා ඉෂ්ඨ කරනවා. එය පැසසිය යුත්තක්. ඇත්ත වශයෙන්ම ලේඛකයෙකුට හඬ නගන්න වයස බාධාවක් වෙන්නෙ නෑ කියන කාරණාව කුරුප්පු මහත්තයට හොඳට ගැලපෙනවා. ඒත් ඇත්තටම අද නිර්මාණ සමාජයෙන් එබඳු හඬක් නැගෙන්නෙ නැහැ. ඇහෙන්නේ හීන් කෙඳිරිලි.

මේ හිතන්න බැරි අංසබාග සමාජය තුළ එතුමා අපිට හිතන්න කතා කරනවා. මේ නිරුවත් සත්‍යයට සලු පිළි අන්දන්න කතා කරනවා. මේ සමස්ත සංස්කෘතික ශෝකාන්තයෙන් ආධ්‍යාත්මික මරණයට පත් නොවී පණ ගහන්න කතා කරනවා. උප්පරවැට්ටි වලින් සාහිත්‍ය ගාල් කරන්න බැහැ. මට මතක් වෙනවා මනමේ නාට්‍යයේ දිසාපාමොක් ඇඳුරු මෙහෙම කියනවා.

විද්‍යා සාංගරයේ පතුළෙන් ගොඩ ගෙන
අගනා මාණික්‍ය පළඳම් සිසු ගෙල